**"දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය"**

මගේ අංකය: **NP/19/11/Dept/Cir**

**2016.05.16**

**චක්‍රලේඛ අංකය: 04/2016 ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, උතුරු පලාත.**

සියළුම දිස්ත්‍රික් නිලධාරින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින් වෙත,

## ග්‍රාම සංවර්ධන සමිතිවලට සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවලට මුදල් නිදහස් කිරීම.

(1) උතුරු පලාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කල, ක්‍රියාන්විත ග්‍රාම සංවර්ධන සමිතිවලට සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවලට රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මගින් ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීමෙහිලා උත්තරීතර අරමුණින් රජයේ මුදල් ලබා දී ඇත. සමිතිවල ක්‍රියාකාරකම් තුළින් සිදු කරනු ලැබූ ආදායම් නැංවීමේ සැලැසුම් හා ක්ෂුද්‍ර ණය ව්‍යාපෘති මගින් මෙම මුල් අරමුදල දහගුණයකින් ඉහළ ගොස් තිබීම දකින්නට ලැබුණි. එනමුත් පසුගිය කාලවල බොහෝ දෙනෙකු විසින් පාලනයකින් තොරව, නිසි අරමුණින් බැහැරව, නොයෙකුත් මාර්ගවලින් මෙම අරමුදල අවභාවිතා කර තිබීම දෙපාර්තමේන්තුව විසින් අවධාරණය කර ඇත.

(2) උතුරු පලාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ නියමය පරිදි, ගරු ග්‍රාම සංවර්ධන අමාත්‍යවරයා සමග මෙම කරුණ සම්බන්ධිතව කරන ලද සාකච්ඡාවට අනුව මෙය යම් පාලනයකට යටත් කිරීමට පියවර ගන්නා මෙන් කරන ලද නියමයට අනුව උතුරු පලාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කල, ක්‍රියාන්විත සියළුම ග්‍රාම සංවර්ධන සමිති සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිති විගණනයට භාජනය කර, එකී විගණන නිරීක්ෂණ පදනමින් මූල්‍යමය කටයුතු නිරවුල් කරමින් පවතී. මෙයට අනුව එළඹෙන වසරයේ සිට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කල ක්‍රියාන්විත සියළුම සමිති සඳහා පොදුවේ වන ගිණුම් තැබීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරලීමට නියමිතව ඇත. මෙය අඛණ්ඩ විගණනය පහසු කරවීමට මාර්ග පහදා දෙනු ඇත.

(3) මෙයට අනුව පහත සඳහන් කරුණු පදනම් කරගෙන, සමිති එහි ක්‍රියාකාරකම් සඳහා මුදල් නිදහස් කිරීම බැංකු ගිණුමෙන් කලයුතු වීම හා මුදල් නිදහස් කිරීම පිණිස පොදුවේ වන ගිණුම්කරණය අනුගමනය කරන බව සහතික විය යුතු බව සාකච්ඡාවේ දී තීරණය විය.

(3.1) සමිතියක අරමුදලින් රුපියල් 1,000.00ක (රුපියල් එක් දාහක් පමණක්) මුදල නිදහස් කිරීම සඳහාවන අනුමැතිය ග්‍රාම සංවර්ධන නිලධාරියා වෙතින් ද, එම මුදලට වඩා වැඩි මුදලක් නිදහස් කිරීමට අධ්‍යක්ෂකවරයා වෙතින් ද අනුමැතිය ලබාගත යුතුය.

(3.2) චක්‍රීය ක්‍රමයේ ක්ෂුද්‍ර ණය අරමුදල, එකී අරමුණට හැර වෙනත් කිසිදු ක්‍රියාදාමයකට නිදහස් නොකල යුතුය.

(3.3) සමිතියක් තමා පිහිටි ප්‍රදේශයේ සංවර්ධනයට දායකත්වය ලබාදීමට ඉදිරිපත් වන්නේ නම්, ඒ සඳහාවන සුදුසු සාධාරණීකරණ සමග ප්‍රාදේශීය ලේකම්වරයාගේ හා ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශ සමග අධ්‍යක්ෂකවරයා වෙතින් අනුමැතිය ලබාගෙන, සමිතියේ අරමුදල් නිදහස් කල යුතුය.

(3.4) සමිතියක් තම සංවර්ධනයට සමිතියේ අරමුදල් පරිහරණය කිරීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහාවන සුදුසු සාධාරණීකරණ සමග ප්‍රාදේශීය ලේකම්වරයාගේ හා ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශ සමග අධ්‍යක්ෂකවරයා වෙතින් අනුමැතිය ලබාගෙන, සමිතියේ අරමුදල් නිදහස් කළ යුතුය.

(3.5) සමිතියේ ආදායම ඉහළ නැංවීම පිණිස සමිතිය විසින් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ සාධ්‍යතා සම්පතින් වන ජීවනෝපාය ක්‍රියාකාරකම්වලට සුදුසු සාධාරණීකරණ සමග ප්‍රාදේශීය ලේකම්වරයාගේ හා ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශ සමග අධ්‍යක්ෂකවරයා වෙතින් අනුමැතිය ලබාගෙන, සමිතියේ අරමුදල් නිදහස් කළ යුතුය.

(3.6) සමිතියේ අරමුදලින් ඉහත සඳහන් (3.3), (3.4) හා (3.5) යන ක්‍රියාකාරකම්වලට මුදල් නිදහස් කරලීමට අවශ්‍ය වන්නේ නම්, විශේෂ මහා සභා රැස්වීම තුළින් දායක මුදල් ගෙවීම් කරන සියළුම සාමාජිකයන්ට කරුණු පැහැදිල කර දී, රැස්වීමේ වාර්තාව සමග මුදල් නිදහස් කිරීම සඳහාවන ඉල්ලීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ හා ග්‍රාම සංවර්ධන නිලධාරියාගේ නිර්දේශ සමග දිස්ත්‍රික් නිලධාරියා මගින් අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ, අනුමැතිය ලබාගත යුතුය.

(3.7) ප්‍රදේශයේ පවත්වනු ලබන වෙනත් ආයතන සම්බන්ධවන වැඩසටහන්වලට ඒ ඒ රජයේ ආයතනවලින් මුදල් වෙන් කරනු ලබන හෙයින්, ඒ සඳහා සමිතියේ මුදල් ලබාදීම අනුමත නොකරනු ලැබේ.

(3.8) ප්‍රදේශයේ, ගමේ සිදුවන වෙනත් සාධාරණත්වයක් නොවන ප්‍රජා වැඩසටහන්වලට සමිතියේ මුදල් ලබාදීම අනුමත නොකරනු ලැබේ.

(3.9) ඉහත සඳහන් ක්‍රියාදාමයන්ට අනුව සමිතියේ මූල්‍ය පරිපාටිය ක්‍රියාත්මක කළ යුතුය. අදාළ පරිපාටිවලට පරිබාහිරව කිසිදු කටයුත්තක් සිදු කරලීමට කවර හෝ තැනැත්තෙකුට බලය පවරා දී නොමැති බව ඔබගේ අවධානයට යොමු කරමි. තවද, ආපදා සමයේ දී පමණක් මෙම පරිපාටිය අවස්ථාවෝචිතව තීරණය කිරීමට හැකිය.

(3.10) මෙම චක්‍රලේඛයේ තොරතුරු ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිති පරිපාලකයින්ට පැහැදිලි කර දෙමින් ද, මෙහෙය වීමෙන් ද, ඔවුන්ගේ සහාය ඇතිව අදාළ අරමුණු මුදුන්පත් කරලීමට ක්‍රියාත්මක කළ යුතුය.

(3.11) මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන 2016.05.16 වැනි දින සිට බල පැවැත්විය යුතුය.

ජේ.ජේ.ෆෙලිසියන්,
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
උතුරු පළාත.

**"දෙමළ බසින් - සිංහල බසට භාෂා පරිවර්තනය"**

පිටපත්:-

1. අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්, ධීවර, ප්‍රවාහන, වෙළෙඳ හා වාණිජ, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන හා මෝටර් රථ වාහන ප්‍රවාහන අමාත්‍යාංශය, උතුරු පළාත. - **අමාත්‍යවරයාගේ කාරුණික දැන ගැනීම පිණිස.**
2. ප්‍රධාන ලේකම්, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
3. ලේකම්, ධීවර, ප්‍රවාහන, වෙළෙඳ හා වාණිජ, ග්‍රාම සංවර්ධන, මාර්ග සංවර්ධන හා මෝටර් රථ වාහන ප්‍රවාහන අමාත්‍යාංශය, උතුරු පළාත. - **කාරුණික දැන ගැනීම පිණිස.**
4. දිස්ත්‍රික් ලේකම්, ………………………….. - **කාරුණික දැන ගැනීම පිණිස.**
5. සහකාර විගණකාධිපති, උතුරු ප්‍රාදේශීකය - **ඔබගේ කාරුණික දැන ගැනීම පිණිස.**
6. ප්‍රධාන අභ්‍යන්තර විගණකාධි, උතුරු පළාත. - **ඔබගේ කාරුණික දැන ගැනීම පිණිස.**
7. ප්‍රාදේශීය ලේකම්, ………………….. - **ඔබගේ කාරුණික දැන ගැනීම පිණිස හා මෙහෙයවීම පිණිස.**
8. ප්‍රාදේශීය මට්ටමින් වන සමිතිහි සංගමය - **ඔබගේ කාරුණික දැන ගැනීම පිණිස හා සමිතිවලට උපදෙස් ලබාදී ක්‍රියාත්මක කරලීම පිණිස.**